**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2018**
**-----------------------------------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එහි පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 සහ 80 ඡේදවලට පටහැනිව වසර 02 ත් 06 ත් අතර කාලයක සිට පැවත එන එකතුව රු.568,616 ක් වූ වත්කම් ශේෂ 03 ක් හා රු.173,600 ක් වූ වගකීම් ශේෂයක් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පිළිවෙලින් ජංගම වත්කම් හා ජංගම වගකීම් වශයෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළ දී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම්, ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු අතර වාර්තා කරන දිනෙන් පසු මාස 12 ක් ඇතුළත දී නිරවුල් කිරීමට නියමිත වගකීම්, ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14(අ) ඡේදයට අනුකූල නොවී අවස්ථා දෙකක දී වත්කම් ගිණුම්ගත කර තිබීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් රු.12,421,682 ක් වැඩියෙන්ද ජංගම වත්කම් රු.954,575 ක් අඩුවෙන්ද සමුච්චිත අරමුදල රු.11,467,107 කින් වැඩියෙන් ද දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන් අස්ථිත්වය වෙත ගලා ඒමේ හව්‍යතාවක් ඇති විට පමණක් වත්කමක් ලෙස හඳුනා ගත යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදයට අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය අනුව පොත්වල අගය ශූන්‍ය වූ පිරිවැය | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.54,717,921 ක් වූ වත්කම් අයිතම 619 ක් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයට පටහැනිව ක්‍රියාකළ හැකි තත්ත්වයට ස්ථාපිත කර නොමැති වත්කමක් සඳහා 2018 දෙසැම්බර් 31 දිනට රු.1,845,320 ක් ක්ෂය කර තිබුණි. එබැවින් ජංගම නොවන වත්කම් හා සමුච්චිත අරමුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු එනම් කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත අවශ්‍ය ආකාරයෙන් ක්‍රියාකළ හැකි තත්ත්වයේ හා ස්ථානයේ තිබෙන විට ක්ෂය කිරීම ආරම්භ කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව අනාගත සේවක වැටුප් වැඩිවීම්, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයු ගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු වේ. මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී සේවකයින් 157 ක් සඳහා පාරිතෝෂික ලෙස රු.6,616,165 ක වෙන්කිරීම් සිදුකර තිබුණ ද පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කරගත යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පැරණි ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා මුල් මාස 04 වෙනුවෙන් රු.3,182,045 ක් වැඩියෙන් ක්ෂය කර තිබීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය හා මූල්‍ය නොවන වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමක් මත බෙදා හළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ විද්‍යාගාරවල ඉතිරිව පැවති රසායනික උපකරණ 305 ක් හා රසායනාගාර ද්‍රව්‍ය අයිතම 04 ක්, GTRI ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය වෙත ලද ආරක්ෂණ පද්ධතියට අයත් උපකරණ, අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙතින් පරිත්‍යාග වශයෙන් ලද පිරිවැය රු.2,830,191 ක් වූ විද්‍යාත්මක උපකරණය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පැරණි ගොඩනැගිල්ලක ඉවත් කිරීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර දී 2018 අප්‍රේල් 24 දින සිට ප්‍රයෝජනයට ගනු ලබන නව ගොඩනැගිල්ල යන වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අදාළ වත්කම්වල පිරිවැය නිවැරදිව අගය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති රු.7,088,994 ක රඳවාගත් මුදල් වෙනුවෙන් ගෙවිය යුතු රු.850,679 ක වැට් බදු ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ගෙවිය යුතු වගකීම් හඳුනාගෙන නිසි පරිදි ඒවා ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තර | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරමාණුක ශක්ති අධිකාරිය සඳහා 2010 මැයි 25 දින ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් හා 2011 ජනවාරි 13 දින බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. නමුත් එයට අනුගත නොවී 2012 මැයි 23 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණයක් පරිදි පෙර පැවති බඳවා ගැනීම් පරිපාටිය මත නිලධාරීන් විසිදෙදෙනකු සඳහා උසස්වීම් එකක් හෝ දෙකක් ලබා දී එම උසස්වීම් මත 2005 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක සිට බලපැවැත්වෙන පරිදි වැටුප් ගෙවා තිබුණි. | මෙම නිරීක්ෂණයේ සඳහන් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඉදිරි පියවර ගත යුතුව ඇති බව දන්වා සිටිමි. | නිසි අධිකාරී බලයකින් තොරව උසස්වීම් ලබා දීම් සිදු නොකළ යුතු අතර මෙය නිවැරදි කිරීම සඳහා මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවකයෙකු විසින් 2010 වර්ෂයේ දී එවකට පරමාණුක ශක්ති අධිකාරියට එරෙහිව අංක SC/FR/NO.662/2010 දරන නඩුවක් පවරා තිබුණි. මෙම නඩුව සම්බන්ධව අධිකරණයේදී මණ්ඩලය විසින් වගඋත්තරකරුවන් සියළු දෙනාගේම එකඟත්වය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පැමිණිලිකාර පාර්ශවය 2006 වර්ෂයේ සිට MM වැටුප් කේතයේ වැටුප් පරිමාණයන් ලබා දීම සඳහා එකඟතාවයකට පැමිණ තිබුණි. මෙහි දී අධ්‍යක්ෂ මණඩලය විසින් රජයේ අයිතිවාසිකම්වලට හානිදායක වන ආකාරයෙන් තීන්දු ගැනීමක් සිදු වී තිබුණි. | මෙම නිරීක්ෂණයේ සඳහන් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඉදිරි පියවර ගත යුතුව ඇති බව දන්වා සිටිමි. | නිසි අධිකාරී බලයකින් තොරව තීරණ ගැනීම් සිදු නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජයේ අයිතිවාසිකම්වලට හානිදායක වන ආකාරයෙන් ගත් තීන්දු අනුව දැනට කටයුතු කිරීම මුදල් රෙගුලාසි 128(1)(ජ) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් නිවැරදි කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම | (අ) | 2018 ඔක්තෝබර් 03 දිනැති අංක POE/B/AEB/2018/18 හා POE/B/AEB/2018/18(01) දරන ලිපි මඟින් නිලධාරීන්ට වැටුප් ගෙවීම සම්බන්ධව තොරතුරු ඉල්ලා තිබුණු අතර වරින් වර සිහිකැඳවීම් 03 ක් සිදුකර තිබුණ ද මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව මෙම පනත යටතේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේදී විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ අධිකාරිය ලත් කවර හෝ තැනැත්තෙකු විසින් ඉල්ලා සිටිනු ලබන යම් අවශ්‍යතාවයක් විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ඔක්තෝබර් 08 දිනැති අංක POE/B/AEB/2018/18 දරන ලිපිය මගින් ඉල්ලා ඇති පරමාණුක බලශක්ති මණ්ඩලයේ සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාගත් නිලධාරින් හතර දෙනෙකුගේ තොරතුරු ඇතුළත් ලිපිගොනු අස්ථානගත වී ඇති බැවින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම ලිපිගොනු අස්ථානගතවීම පිළිබඳව මේ වන විට සොයා බැලීමක් සිදු වෙමින් පවතී. ඒ අනුව නැවත පිළිතුරු ලිපියක් එවීමට බලාපොරොත්තු වෙමි. | -එම- |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| | (i) 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 හි (අ) | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් අපහරණය කළ යුතු භාණ්ඩ අයිතම 110 ක් අපහරණය කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 2017 ජුලි 14 දිනැති අංක 03/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ ලබාදුන් එකතුව රු.1,343,882 ක් වූ දේශීය මීලට ගැනුම් අත්තිකාරම් 03 ක් 2018 දෙසැම්බර් 31 දිනට පියවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.105,083,932 ක් වූ විදේශ ප්‍රදාන ලැබීම් 11 ක් භාණ්ඩාගාරය හරහා ලබා නොගෙන සෘජුවම මණ්ඩලය වෙත ලබාගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මෙහෙයුම් ප්‍රතිඵලය රු. 413,699 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,456,454 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,870,153 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ගැමා මධ්‍යස්ථානයේ ආදායම රු. 11,613,806 කින් ද භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන රු. 8,150,000 කින් ද ආහාර සාම්පල් පරීක්ෂාව මගින් ලද ආදායම රු. 3,234,899 කින් ද ඉහළ ගොස් තිබුණ ද, නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ වියදමෙහි ප්‍රමාණාත්මක අඩුවීමක් සිදු නොවී එහි ආදායම රු. 8,012,554 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 ක මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2015 වර්ෂයේ දී රු. 20,985,774 ක් වූ ඌණතාවය, 2016 වර්ෂය වන විට රු. 3,864,974 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණ ද 2017 වර්ෂය වන විට රු. 1,456,454 ක අතිරික්තයක් දක්වා පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එය රු. 413,699 ක ඌනතාවයක් දක්වා තවදුරටත් පිරිහී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය නැවත ගැලපීමෙන් පසු 2015 වර්ෂයේ දී රු. 69,922,744 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2018 වර්ෂය අවසානයට රු. 120,459,832 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අයනීකාර විකිරණ කටයුතුවලට යෝග්‍ය ජනාකීර්ණ හා නාගරික නොවන ප්‍රදේශයක පිහිටි හෝමාගම පිටිපන මාහේනවත්ත | අදහස් දක්වා නොතිබුණි | මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව රජයේ වැඩ හා සේවාවන් ඉටු කිරීමේ දී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාව -යෙන් යුතු ව ඉටු කළ යුතු අතර මුදල් රෙගුලාසි 128 (1) (ඵ) |

| | | | |
|---|---|---|---|
| | අක්කර 03 ක ඉඩම වඩාත් සුදුසු වුවද, නිලධාරීන්ගේ පහසුව පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම හේතුවෙන් එය ප්‍රතික්ෂේප කර තිබුණු අතර ජනාකීර්ණ ප්‍රදේශයක් වන මාලඹේ පිහිටි ඉඩමක් මේ සඳහා තෝරා ගැනීම නිසා එහි ඉදිකිරීම් කටයුතු ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය මත පසුව අතරමඟ නැවතී තිබුණි. ඉහත පරිදි කටයුතු කිරීම නිසා අදාළ ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත් පිරිවැය ඇස්තමේන්තුව රු.419,069,769 සිට රු.925,724,951 දක්වා රු.506,655,182 කින් වැඩි වී තිබුණි. එමෙන්ම ඉහත කටයුතු සඳහා පරමාණු බලශක්ති මණ්ඩලයේ නව ගොඩනැගිල්ල පිහිටි ඉඩම හා මාලඹේ ඉඩම තක්සේරු කර තිබූ අතර රු.1,420,846 ක් වූ තක්සේරු ගාස්තුව සම්පූර්ණයෙන්ම මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | | ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි විසින් රජයේ කටයුතු ඉටු කිරීමේ දී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකබාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වන බව සහතික විය යුතු ය. |
| (ආ) | 2017 ඔක්තෝබර් 01 දින සිට විගණන දිනය වූ 2019 මාර්තු 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ නිලධාරීන් තිදෙනෙකුට හා නිලධාරීනියන් පස්දෙනෙකු හට ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නොවන තනතුරු වල නිරත වූ සේවා කාලය ද සැලකිල්ලට ගෙන රු. 675,000 ක වෘත්තීය දීමනාවක් වැඩිපුර ගෙවා තිබුණි. ආයතනයේ ගණන්දීමේ නිලධාරියා මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව මෙය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම නිරීක්ෂණයේ සඳහන් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඉදිරි පියවර ගත යුතුව ඇති බව දන්වා සිටිමි. | වෘත්තීය දීමනා ගෙවීමේ දී අදාල චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවා ඇති දීමනාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මණ්ඩලයේ නිලධාරින් තුන්දෙනෙක් සහනදායී මෝටර් රථ බලපත්‍ර හිමිකම ලැබීමට නියමිත දිනට ආසන්න වශයෙන් වසර 05 ත් 08 ත් අතර කාලයකට පෙර පළමු බලපත්‍රය ලබා ගෙන තිබුණු අතර දෙවන බලපත්‍රය ද වසර 02 ත් 04 ත් කාලයකට පෙර ලබා ගෙන තිබුණි. මීට අමතරව තවත් නිලධාරින් 05 දෙනෙක් ආසන්න වශයෙන් වසර 01 ත් 06 ත් අතර කාලයකට පෙර පළමු බලපත්‍රය ලබා ගෙන තිබුණි. ආයතනයේ ගණන්දීමේ නිලධාරියා මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව මෙය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම නිරීක්ෂණයේ සඳහන් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඉදිරි පියවර ගත යුතුව ඇති බව දන්වා සිටිමි. | සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ දී අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැරදි ලෙස ලබා දී ඇති බලපත්‍ර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ පිහිටුවා ඇති පරමාණුක බලශක්ති මණ්ඩලයේ පිහිටුවීමේ අරමුණු අතර, එක් අරමුණක් වනුයේ න්‍යෂ්ටික යොදා ගැනීම් සම්බන්ධයෙන් නියාමන අවශ්‍යතා ඉටු කිරීම පිණිස විකිරණ ආරක්ෂාව සඳහා වන සේවා සැපයීම වේ. නමුත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් කාර්යක්ෂමතාවයකින් එය ඉටු වී නොතිබුණි. | TLD කාඩ්පත් භාවිතා කරන ආයතන විසින් පසුබිම් විකිරණ කාඩ්පත් ප්‍රමාද වී එවීම, TLD කාඩ් පත් භාවිතා කල කාලයට පසුව එළඹෙන මාසය තුළ නොඑවීම, TLD කියවීම් යන්ත්‍රවල තත්ත්ව පාලන පරීක්ෂාවන් හා ක්‍රමාංකණ කටයුතු සිදු කිරීම සහ ආයතනය නව ගොඩනැගිල්ලට පැමිණීම නිසා නව විද්‍යාගාරයේ TLD කියවනයන් ප්‍රතිස්ථාපනය හා ක්‍රමාංකණය කිරීම සඳහා යම් කාලයක් ගත වීම වැනි සාධක එම කාඩ්පත් කියවීම හා ප්‍රතිඵල වාර්තා නිකුත් කිරීමට සැලකිය යුතු ප්‍රමාදයක් සිදුවීමට හේතු විය. කෙසේ වෙතත් විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය සීමිත මානව සම්පත් සහිතව රටේ සියළුම විකිරණ ආරක්ෂණ හා සුරක්ෂණ සේවා සැපයීමට | පනතේ අරමුණු ළඟා කර ගැනීමට අදාල කාර්යයන් ඉටු කිරීමේ දී කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු සිදු කරන අංශයක් වන අතර TLD සේවාව ලබා ගන්නා ආයතනවල අතපසු කිරීම් හා තාක්ෂණික අභියෝග හමුවේ මාස 02 ක් තුල විකිරණ මාත්‍රා වාර්තා ඒ ඒ ආයතන වෙත යැවීමට කටයුතු සිදු කර ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (එවකට පරමාණුක ශක්ති අධිකාරිය) විසින් 1981 වර්ෂයේ සිට 2014 වර්ෂය තෙක් කාලපරිච්ඡේදය දක්වා සේවක අර්ථසාධක දායක මුදල්, අරමුදලට නියමිත පරිදි බැර නොකිරීම හේතුවෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වගන්තිය අනුව සේවක අර්ථසාධක අරමුදලට දඩ මුදල් වශයෙන් රු. 4,790,466 ගෙවා තිබුණි. | පරමාණුක ශක්ති අධිකාරියේ සේවක මණ්ඩලය වෙනුවෙන් 1981 සේවා නියුක්තියන්ගේ භාර අරමුදල ඇරඹීමට පෙර දායක මුදල් ප්‍රේෂණය කර ඇත්තේ ආයතනයෙන් සියයට 15 ක් හා සේවකයන්ගෙන් සියයට 10 ක් වශයෙනි. මෙසේ සියයට 15 ක් ම පැවති සේවා යෝජකගේ ප්‍රතිශතය සියයට 12 ක් දක්වා අඩුකර ඇත්තේ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අංක 312 හා 1981 ජුනි 26 දිනැති චක්‍රලේඛය පදනම් කර ගෙන වේ. ඒ අනුව සේවක අර්ථසාධක අරමුදල් පනතේ නියමයන්ට අනුකූලව 3:2 අනුපාතයට දායක මුදල් ගණනය කිරීම සිදු වී නොමැති බව විගණකාධිපති විසින් 2011 මැයි 26 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමේ දී දැනුම් දී ඇත. එම කමිටුව මෙය නිවැරදි කළ යුතු බව දන්වා ඇති අතර පෙර කාලයට අදාල හිඟ දායක මුදල් ගෙවීමේ දී කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඊට අදාල අධිභාර ගෙවන ලෙස දන්වා ඇත. කෙසේ වෙතත් මේ වන විට නිවැරදි ලෙස දායක මුදල් ගෙවන අතර ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවන ලෙස කටයුතු කරන බව සඳහන් කරමි. | සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමේ දී සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානවලට අනුකූලව මුදල් බැර කළ යුතු අතර දඩ මුදල් ගෙවීම සම්බන්ධව මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් | අධිකාරියේ සේවක වෘත්තීය සමිතිය විසින් 1985 අංක 01 දරන | සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් |

| | | |
|---|---|---|
| පනතේ 16 වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට නිවැරදිව දායක මුදල් බැර නොකිරීම හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2014 මැයි මස දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු. 600,383 ක් දඩ මුදල් වශයෙන් ගෙවා තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් පනත (සංශෝධිත) අනුව මූලික වැටුපට අමතරව සියළු දීමනා සඳහා අර්ථසාධක දායක මුදල ගණනය කළ යුතු බව පෙන්වා දීම අනුව කම්කරු කොමසාරිස්වරයාගේ උපදෙස් මත සියළු දීමනා පදනම් කර ගෙන දායක මුදල් ගණනය කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි දායක මුදල් ගෙවීමට කටයුතු කිරීමේ දී එම කාලපරිච්ඡේදයට අදාල දඩ මුදල් ගෙවීමට සිදු වූ අතර ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවන ලෙස කටයුතු කරන බව සඳහන් කරමි. | ගෙවීමේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුකූලව මුදල් බැර කළ යුතු අතර දඩ මුදල් ගෙවීම සම්බන්ධව මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික ගැමා මධ්‍යස්ථානයේ කෙටි කාලීන ප්‍රවිකිරණ ප්‍රභවයේ උපරිම ධාරිතාවය කිලෝකියුරි 3000 (3000 kci) වුවත් මේ දක්වා කිලෝකියුරි 250 (250 kci) ක ධාරිතාවයක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. ඒ අනුව කෙටිකාලීන නිෂ්පාදන ධාරිතාවයෙන් සියයට 08 ක් පමණක් වන බැවින් මධ්‍යස්ථානයේ නිෂ්පාදන ධාරිතාවය ඌන උපයෝජන මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | පවත්නා වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා ගැමා මධ්‍යස්ථානයේ ප්‍රවිකිරණ ප්‍රභවයේ ධාරිතාවය කිලෝකියුරි 250 ක ධාරිතාවයකින් පවත්වා ගෙන යාම ප්‍රමාණවත් බැවින් එසේ කටයුතු කොට ඇති අතර වෙළඳපොළ ඉල්ලුම වර්ධනය කර ගත් පසු උපරිම ධාරිතාවයෙන් භාවිතා කිරීමට බලාපොරොත්තු වේ. | මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව රජයේ වැඩ හා සේවාවන් ඉටු කිරීමේ දී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතු ව ඉටු කළ යුතු අතර මුදල් රෙගුලාසි 128 (1) (එ) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි විසින් රජයේ කටයුතු ඉටු කිරීමේ දී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකබාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වන බව සහතික විය යුතු ය. |
| (ආ) 2015 දෙසැම්බර් 02 දින පිරිවැය රු. 9,184,390 ක් වූ Isotope Ratio Mass Spectro Meter යන උපකරණය මුදල් ගෙවා මිලදී ගෙන තිබූ අතර මණ්ඩලය වෙත 2018 අගෝස්තු 09 දින ලැබී තිබුණි. නමුත් මෙම උපකරණය 2019 අප්‍රේල් 30 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතිණි. | අදහස් දක්වා නොතිබුණි | |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 4 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල නොකර රු.මිලියන 100 ක් වටිනා විෂයයන් 39 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් 2018 වර්ෂයට පමණක් සකස් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ රු. 6,175,788 ක් වූ ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රසම්පාදනය කර තිබූ නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 4 (2) (3) වගන්තියේ දැක්වෙන ආකාරයට ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම නිතිපතා යාවත්කාලීන කළ යුතු ය. |
| (ඇ) 2018 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නමුත් 2018 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු කල ද මෙතෙක් ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොමැති රු. මිලියන 50.964 ක් වටිනා විෂයයන් 25ක් තිබුණි. | අදහස් දක්වා නොතිබුණි | ප්‍රසම්පාදන සැලැස්මට අනුව අදාල කාලපරිච්ඡේදය තුල ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ දී ඉදිකිරීම් අවසන් කර තිබූ මූලික මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. 308,653,543 ක් වූ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ සංශෝධිත මුළු පිරිවැය රු. 428,981,984 ක් වී තිබුණි. ඒ අනුව පිරිවැය විචලනය සියයට 39 ක් වී තිබුණ ද 2012 අගෝස්තු 08 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එම ඉදිකිරීමේ ඇස්තමේන්තුව අදාල කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර මුළු විචලනයෙන් සියයට 35 ක් වූ රු. 42,533,542 ක වියදම් වෙනුවෙන් අනුමැතිය මෙතෙක් ලබාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | අදාල රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 10 ක් ඉක්මවූ පිරිවැය විචල්‍යතාවයන් පැන නගින බව පෙනීයන අවස්ථාවන්හිදී ඊට අදාල පිරිවැය ඇස්තමේන්තු සංශෝධන යෝජනා සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරිම සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවිය යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවද, මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන දින 48 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි | අදාල රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට පෙර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| <u>(අ) ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධන දර්ශකවල ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රමාණය තාත්ත්විකව සැලසුම් නොකිරීම</u> | | |
| (i) නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ හා මණ්ඩලයේ ජෛව විද්‍යාත්මක අංශයේ භෞතික කාර්ය සාධනය හා මූල්‍ය කාර්යසාධනය සැසඳීමේදී ප්‍රමාණාත්මක වෙනසක්ම නිරීක්ෂණය වීම.<br><br>(ii) ගැමා මධ්‍යස්ථානයේ ප්‍රමාණවත් පරිදි අපේක්ෂිත ඉලක්ක තබා නොගැනීම නිසා සත්‍ය ක්‍රියාකාරිත්වය අපේක්ෂිත ක්‍රියාකාරිත්වයට වඩා ඉහළ තත්ත්වයක් පෙන්නුම් කිරීම. | නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ආරම්භයේ දී ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අපේක්ෂිත ඉලක්කයන් සම්බන්ධව අධිතක්සේරුවක් සහිතව ඉදිරිපත් කර තිබූ බැවින් එය නිවැරදි කර තිබූ අතර ජෛව විද්‍යාත්මක අංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය දැක්වීමේ දී මූල්‍ය කාර්යසාධනය යටතේ සත්‍ය ප්‍රමාණය වශයෙන් වැරදි අගයක් සටහන් වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධන දර්ශකවල ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රමාණය තාත්ත්විකව සැලසුම් කළ යුතුය. |
| <u>(ආ) ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ප්‍රමාණවත් පරිදි ළඟා කර නොතිබීම.</u> | | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ප්‍රමාණවත් පරිදි ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (i) සමාලෝචිත වර්ෂය තුළ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය සහතික පත්‍ර පාඨමාලා, වැඩමුළු පැවැත්වීම හා නිර්විනාශක පරීක්ෂණ විභාග පැවැත්වීම සම්බන්ධ මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම්ගත ප්‍රමාණයට වඩා සත්‍ය කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු බව නිරීක්ෂණය විය. | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම්ගත ප්‍රමාණය හා සත්‍ය ප්‍රමාණය සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කෙරේ. | |
| (ii) ජෛව විද්‍යාත්මක අංශය ගැමා වර්ණාවලික්ෂමිතිය මගින් ලබා දෙන ලද විශ්ලේෂක සේවා අංශයේ ක්‍රියාකාරකම්වල සැලසුම්ගත ඉලක්ක ලබා ගැනීම සියයට 36 කට වඩා අඩු වේ. | නිවැරදි මූල්‍ය කාර්යසාධන සත්‍ය ප්‍රමාණය අනුව විශ්ලේෂණ සේවා අංශයේ ක්‍රියාකාරකම්වල සැලසුම්ගත ඉලක්ක ලබා ගැනීම දක්වා ඇති ප්‍රමාණයට වඩා ප්‍රගතියක් පෙන්වයි. | |

<u>(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් කාර්යයන් ඉටු නොකිරීම.</u>

| | | |
|---|---|---|
| (i) ගැමා වර්ණාවලික්ෂමිතිය මගින් ලබා දෙන ලද විශ්ලේෂක සේවා අංශයේ පහත ක්‍රියාකාරකම් 2018 වර්ෂය තුළ දී ඉටුකර නොතිබුණි.<br>• නව විශ්ලේෂණ ක්‍රම ස්ථාපනය හා විෂය පථය දීර්ඝ කිරීම<br>• ලබාගත් දත්තවල නියැදි විශ්ලේෂණය<br>• තොරතුරු විශ්ලේෂණය හා පරිවර්තනය | නව විශ්ලේෂණ ක්‍රම ස්ථාපනය කිරීම Q3 හා Q4 කාල පරාසය තුළ කටයුතු කළ යුතු බැවින් ඉදිරියට ද එම කටයුතුවල නිරත වන අතර අවශ්‍යතාවය ඇති නොවූයෙන් විෂය පථය දීර්ඝ කිරීම සිදු නොකරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) න්‍යෂ්ටික කෘෂි ඒකකයේ පහත සැලසුම්ගත ක්‍රියාකාරකම් 2018 වර්ෂය තුල ඉටු කර නොතිබුණි.<br>• විරල මූල ද්‍රව්‍ය සාම්පල් විශ්ලේෂණය<br>• වෙළඳපොලෙන් සාම්පල් රැස් කිරීම<br>• එම සාම්පල් සැකසීම හා ස්ථායී සමස්ථානය සඳහා විශ්ලේෂණය<br>• කිරිපිටිවල අනවශ්‍ය ද්‍රව්‍ය (යූරියා, ෆෝමලින්, කල්තබා ගන්නා ද්‍රව්‍ය) ඇතුළත් ද යන්න පරීක්ෂාව | අදහස් දක්වා නොතිබුණි. | |
| (ඈ) ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීමෙන් ප්‍රවිකිරණ සේවා යටතේ කෘෂිකාර්මික බීජ ප්‍රවිකිරණය කිරීම හා හයිඩ්‍රොජෙල් පටල නිර්මාණය කිරීම වැනි සේවාවන් ලබාදීමට බලාපොරොත්තු වුණ ද 2018 ක්‍රියාකාරී සැලැස්ම තුල එවැනි සේවා සිදුකිරීමට සැලසුම් කර නොතිබුණි. | පැරණි ගොඩනැගිල්ල තුල හයිඩ්‍රොජෙල් පටල නිර්මාණය කර තිබූ විද්‍යාගාරයේ කටයුතු ආරම්භ කර තිබුණ ද එම විද්‍යාගාර කටයුතුවල ක්‍රියාකාරීත්වය අඩපණ වීම නිසා 2018 ක්‍රියාකාරී සැලැස්මට එම කටයුක්ත ඇතුළත් කර නොමැති අතර මේ සඳහා නව විද්‍යාගාර ප්‍රතිස්ථාපනය කළ යුතුව ඇත. | අනාගත අපේක්ෂිත සේවා සැපයීම් ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේදීද පෙර වර්ෂවල මෙන් ගැමා මධ්‍යස්ථානයේ ප්‍රවිකිරණ සේවා සැපයුම් ආදායමෙන් සියයට 98 ක් ම එක් සේවා ගනුදෙනුකරුවෙක් මත රඳා පවතී. නමුත් ගැමා මධ්‍යස්ථානයේ ප්‍රවිකිරණ සේවා ලබා ගන්නා ගනුදෙනුකරුවන්ගේ වෙළඳපොල කොටස වර්ධනය කර ගැනීමට 2018 - 2020 සංයුක්ත සැලැස්මේ හා 2018 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සැලසුම් කර නොතිබුණි. | වර්තමානයේ ගැමා මධ්‍යස්ථානයේ සේවා ලබා ගන්නා ප්‍රධානම ආයතනය විසින් රජයේ රෝහල්වලට ශල්‍ය අත්වැසුම් ලබා දීම උදෙසා අපගේ සේවාව ලබා ගන්නා අතර මීට අමතරව නව සේවා සැපයුම්කරුවන් ලබා ගැනීමට විවිධ උත්සාහයන් දරා ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනිමින් සිටී. | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැලසුම් කළ යුතු අතර එය සංයුක්ත / ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කළ යුතුය. |

## 4.3 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂයට පසුව එළඹෙන මාස 10 ක් අවසන් වීමට පෙර මණ්ඩලයේ අවසන් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. නමුත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2019 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් පනත ප්‍රකාරව නියමිත කාලය තුළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

## 4.4 කළමනාකරණ වාර්තාවට පිළිතුරු සැපයීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (8) ප්‍රකාරව, එහි (7) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවලට අනුව ඉදිරිපත් කරන වාර්තාව මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් සලකා බැලිය යුතු යි. එසේ සලකා බැලීමෙන් පසු එම පාලක මණ්ඩලය විසින් විගණන වාර්තාවේ පෙන්වා ඇති කරුණු පිළිබඳව ගැනීමට යෝජිත පියවර විගණන වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද දින සිට මාස 03 ක් තුල විගණකාධිපති වෙත දන්වා සිටිය යුතු ය.<br><br>එසේ වුවද 2018 ඔක්තෝබර් 09 දින මණ්ඩලය වෙත නිකුත් කරන ලද 2017 වර්ෂයේ කළමනාකරණ විගණන වාර්තාව සඳහා මණ්ඩලය විසින් මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් පිළිතුරු සපයා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් පනත ප්‍රකාරව කළමනාකරණ වාර්තාව සඳහා නියමිත කාලය තුළ පිළිතුරු සැපයිය යුතුය. |

**4.5 විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඉ) වගන්තිය හා මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව මණ්ඩලය කටයුතු කර නොතිබුණි. 2018 වර්ෂය සඳහා මණ්ඩලය වෙත යොමු කරන ලද විගණන විමසුම් 23 න් 10 ක් සඳහා 2019 අප්‍රේල් 30 දින වන විටත් පිළිතුරු සපයා නොතිබු අතර විගණන විමසුම් 07 ක් සඳහා නිශ්චිත කාල සීමාව ඉක්මවා දින 10 ත් දින 64 ත් අතර කාලයක් ප්‍රමාද වී පිළිතුරු සපයා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරියා සහතික විය යුතුය. |

**4.6 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/2009(01) හි 09 වගන්තිය ප්‍රකාරව සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර එය කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කළ යුතු අතර මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කාර්තුමය වාර්තාවන් පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අදාල කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුමය වාර්තාවන් පිළියෙල කළ යුතුය. |

**4.7 විගණන කමිටු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.1. ඡේදයට අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මාස 03 කට වරක් පැවැත්විය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. 2018 ජුනි 19 දිනෙන් පසු වාර්තාව නිකුත් කරන දින | නොවැළැක්විය හේතු කිහිපයක් මත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ අතර මේ වන විට නව සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇති | අදාල රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

| | | |
|---|---|---|
| වන විට මාස 10 කට අධික කාලයක් ගෙවී තිබුණ ද එම කාල පරිච්ඡේදය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | බැවින් නුදුරු දිනක දී එම රැස්වීම පවත්වනු ඇත. | |

## 4.8 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා සිවිල් සංවිධාන ලෙස හඳුනාගෙන තිබුණු නමුත් එම පාර්ශවයන් වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී පියවර ගනු ඇත. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා සැලසුම් සකස් කළ යුතු අතර එම කාර්යයන් නියාමනය කිරීම, දත්ත පදනමක් බිහි කිරීම හා මණ්ඩලයේ නිලධාරින් / උනන්දුවක් දක්වන පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා සැලසුම් සකස් කර නොතිබු අතර, ඒ සඳහා ක්‍රමවේදයක් ද මේ දක්වා හඳුනාගෙන නොතිබුණි. | මේ සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුව ඇත. | |
| (ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අවශ්‍ය වුවත්, මණ්ඩලය විසින් හඳුනාගෙන තිබු තිරසර සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | |
| (ඈ) තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවධානම හඳුනාගෙන තිබුණි. ඒවා අවම කිරීමට ගත යුතු පියවරයන් වශයෙන් අමාත්‍යාංශය සමඟ නිසි ක්‍රමසම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරින් දැනුවත් කිරීම හා අවශ්‍ය පිළියම් සහ තීරණ ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබුණ ද, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකාරිත්වයේ මැදිහත් වීම ප්‍රමාණවත් නොවූ බව හැඟී යන අතර අමාත්‍යාංශයද දැනුවත් කර එය මග හරවා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා සිටිමි. | |